**වත්තේගම නගර සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වත්තේගම නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ කසළ කරත්ත 02 ක් අළුත්වැඩියාව සඳහා දැරූ රු.168,552 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.5,253,100 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පුරෝකතනය කිරීම අපහසු වූ බව. | නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ කසළ කරත්ත විකිණීමෙන් සමාලෝචිත වර්ෂයට ලැබී තිබුණු රු.440,127 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී දඩ ආදායම රු.165,946 ක් වුවද දෙවරක් ගිණුම්ගත කිරීමෙන් රු.165,946 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීමට දරා තිබුණු ප්‍රාග්ධන වියදම් රු. 191,468 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ආදායම් වියදම් ගිණුමට ගලපා නොමැති බව. | ආදායම් වියදම් ගිණුමේ සටහන් කළ යුතුය. |
| (ඊ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද කඩ කුලී ආදායම රු. 297,125 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂයේ ආර්ථික අපහසුකම් ඇති දරුවන් ට පාසල් පොත් ලබාදීම යනුවෙන් දක්වා රු. 2,500,000 ක් ව්‍යාජ ලෙස ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | නගර සභාවේ කාලය අවසන් වීමත් සමග ව්‍යාපෘතිය නතර වූ බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | පදනමකින් තොරව 2021 වර්ෂයේ ජීප් රථයක් අළුත්වැඩියාව යනුවෙන් දක්වා රු.1,000,000 ක් ව්‍යාජ ලෙස ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | අලුත්වැඩියාව සඳහා යොමුකර ඇති බව. | -එම- |
| (එ) | ඉකුත් වර්ෂවලදී වෙන්දේසි කර හා භාවිතයෙන් ඉවත් කර තිබුණු එකතුව රු.1,071,429 ක වාහන හා යන්ත්‍රෝපකරණ ඒකක 08 ක් තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 405,308 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන ගිණුම් ගතකළ යුතු ය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,420,720 ක වත්කම් විෂයයන් 09 කට අදාළ පැවැත්ම තහවුරු කිරීම් , තහවුරු කිරීමේ ලේඛන, ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදිව හඳුනාගෙන ලේඛන ඉදිරිපත් කරන බව. | ශේෂ තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන හා ලිපිගොනු පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තිය | බල ප්‍රදේශය තුළ පොදු වැසිකිළි පහසුකම් සැපයීම සහ පොදු සහ පෞද්ගලික වැසිකිළි | අදාළ දේපල දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති බව. | පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිසි අයුරින් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | අංක 2235/64 හා 2021 ජූලි 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත | සංවර්ධන අවසර පත්‍රයක් ලබානොගෙන ඉදිකර තිබුණු ගොඩනැගිලි 04 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල කර ගැනීමට අදාළ පාර්ශන දැනුවත් කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 571(3) | කාලය ඉකුත්වූ රු.97,413 ක තැන්පතු ශේෂ 27 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 06 වගන්තිය | 2022 ජූනි 22 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරුවක් ලැබී තිබියදී කඩ 14 ක ගිවිසුම් අලුත්කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ගිවිසුමකට එකඟතාවය පළ නොකරන බව. | චක්‍ර ලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15, 527,690 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,437,587 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,670,000 | 5,646,017 | 6,126,811 | 2,709,147 | 5,631,500 | 5,733,379 | 4,999,314 | 3,189,941 |
| (ii) | කුලී | 100,000 | 8,117,843 | 8,131,162 | 185,808 | 10,000 | 8,257,365 | 8,063,755 | 199,127 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 201,000 | 1,263,865 | 1,235,925 | 30,000 | 251,000 | 1,104,785 | 1,102,725 | 2,060 |
| (iv) | වෙනත් ආදායම් | 1,875,000 | 28,146,281 | 25,825,069 | 10,393,112 | 1,875,000 | 25,739,328 | 20,162,971 | 8,071,900 |
| | | 7,846,000 | 43,174,006 | 41,318,967 | 13,318,067 | 7,767,500 | 40,834,857 | 34,328,765 | 11,463,028 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කායර්සාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,709,148 ක් වූ අතර, එක ඒකකය වරිපනම් බදු හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 30 කින් එකතුව රු.559,591 ක වරිපනම් හිඟයක් අයකර නොතිබුණි. | දේපල තහනම් කිරීම් හා ක්ෂේත්‍ර රාජකාරි මඟින් හිඟ අය කරගන්නා බව. | හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| ii. | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් සිදු කළ යුතු වුවද, 2015 ජනවාරි 02 දිනැති තක්සේරු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු ප්‍රතිශෝධනය සිදුකරනු ලබන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.9,100,788 ක් වූ අතර, එක ඒකකය ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල ගාස්තු ඒකක 570 කින් එකතුව රු.6,611,479 ක් අයකර නොතිබුණි. | හිඟ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අය කළ යුතුය. |
| (ii) | ජල පාරිභෝගිකයින් 757 ක් සඳහා ජල මනු සවිකර නොතිබුණු අතර මෙම පාරිභෝගිකයන්ගෙන් ගෘහස්ථ රු.400 ක් හා ව්‍යාපාර සඳහා 550 ක ස්ථාවර ගාස්තුවක් අය කිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී ජල මනු සවිකර ගාස්තු අයකරන බව. | ජල මනු සවිකර නියමිත ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | බල ප්‍රදේශයට අදාල ජල පාරිභෝගිකයින් 2368 ක් පැවතියද ජල සැපයුම් 760කට අදාළ ජල මනු සවිකර නොතිබුණු අතර ස්ථාවර ගාස්තුව පමණක් අයකර පැවතුණි. ඉන් ජල සැපයුම් 101ක රු.10,000 ක් ඉක්මවූ රු. 1,640,602 ක් විය. | ජල මාපක සවිකර නොමැති බව. | ජල මාපක සවි කර ගාස්තු අයකළ යුතුය. |
| **(ඈ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.492,325 ක් හා මුද්දර ගාස්තු රු.800,000ක් විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කර ඇති බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වාගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසල අංගනයේ PET බෝතල් සහ කසළ වෙන් කරන ස්ථානයේ පොලිතින් ඇතුළු නොදිරන කසල තොගයක් කසළ අංගනය පිහිටි ඉඩමේ කෙලවර වෙල්යායට ගොඩකර තිබුණු අතර වැසි දිනට මෙම ජලය රැඳීමෙන් පරිසරයට හානි දායකව දුගඳ වහනය වෙමින් පැවතිණි. | ඉදිරි වර්ෂයේදී කසළ අංගනයක් ඉදිකරන බව. | කසළ කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලී රථ සේවාවක් පවත්වාගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් විවිධ පුද්ගලයින් අනවසරයෙන් එම කටයුතු අවිධිමත්ව සිදුකර තිබුණි. | පෞද්ගලික ආයතනවලින් හා වෙනත් සභාවලින් අදාළ කාර්යය ඉටුකරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් ජල ව්‍යාපෘති 03 ක සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය 944 - 2496 දක්වා පරාසයක පැවති අතර කොලිෆෝම් (Coliform) බැක්ටීරියාව 56 - 190 අතර පැවතිණි. නගර සභා ආඥා | ඉදිරියේදී පරික්ෂාවන් සිදුකරන බව. | පිරිසිදු පානීය ජලය බෙදා හැරිය යුතුය. |

පනතේ (255 අධිකාරය) 104 වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ගැති ශේෂය රු. 2,488,294 ක් වූ අතර ඉන් වසර 03 ත් 05 ත් කාලයට අදාළ එකතුව රු. 690,876 ක් වූ අතර වසර 05ට වඩා වැඩි කාලයක් පවතින ශේෂය රු. 1,500,976 ක් අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂ පිළිබඳ සොයාබලා කපාහැරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කපා හැරීමට හෝ ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.6,477,189 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු. 4,292,585 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාතලේ පාර දුන්ඔය කුඹුර / පුස්සේපිටිය නොහොත් මියන්පාහේ වත්ත කසළ අංගන භූමියේ නිවාස 08 ක් අනවසරයෙන් ඉදිකර පදිංචිය සඳහා යොදාගෙන තිබුණි. | ඉදිරියේදී පවරාගන්නා බව. | අනවසර පදිංචි කරුවන් ඉවත් කර වත්කම් පවරා ගත යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ මාර්ග පළුදු කිරීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. 221,450 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | තැන්පත් නිරවුල් කළ යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයේ අනතුරට පත් බැකෝ යන්ත්‍රය සම්බන්ධව මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණය අවසන් කර නොතිබුණු අතර මේ හේතුවෙන් වර්ෂ 05 කට අධික කාලයක සිට අළුත්වැඩියා නොකර විනාශ වීමට ඉඩහැර තිබුණි. | මු.රෙ 104(4) පරීක්ෂණ සිදු කර ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අතර යන්ත්‍රය අලුත්වැඩියාකර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාවට අයත් දෙල්ගහලන්ද ඉඩමේ කොටසක පුද්ගලයන් 44 දෙනෙක් භූමිය අත්පත් කරගෙන අනවසරයෙන් පදිංචි වී තිබුණි. | සභාවට පාඩුවක් නොමැති අයුරින් මුදාහැරීමට කටයුතු කරන බව. | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | රු.5,778,125 ක වාහන හා යන්ත්‍රෝපකරණ 07 ක් වසර 04 ත් 15 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට යොමු කර ඇති බව හා අනෙකුත් වාහන ගාල් කර පවතින බව. | වෙන්දේසි කිරීමට හෝ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව නිලධාරීන්ට භාණ්ඩ භාරදී තිබුණද, ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබීම හේතුවෙන් සියලු වත්කම්වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන පරික්ෂා කරන බව. | ලේඛන යාවත්කාලීන පවත්වා ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන්කරන ලද රු.6,567,050 ක සංවර්ධන යෝජනා 27 ක් ඉටුකර නොතිබුණු අතර අයවැය ගත නොකළ රු.11,347,025 ක ව්‍යාපෘති 47 ක් ඉටුකිරීමට කටයුතු කර තිබුණි. | සභා තීරණ මත සිදු කළ බව. | වාර්ෂික අයවැය ලේඛනයට ප්‍රමුඛතාවය දිය යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 04 ක පුරප්පාඩු 09 ක් ද තනතුරු 02 ක අතිරික්තතා 05 ක් ද පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන අතර අතිරික්ත තනතුරු සංවර්ධන නිලධාරීන් බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අප ජල කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළියෙලක් සභාව සතුව නොමැති අතර අපජල කානු පද්ධතියක්ද නඩත්තු කර නොතිබුණි. | අපජල කානු පද්ධතියක් සකස් කිරීමට බලා පොරොත්තු වන බව. | විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |